# ඉබරකි ප්‍රාන්තයේ වාහන අංගනයන් සඳහා වන රෙගුලාසි.

2017 අප්‍රේල් මස පලමුවෙනිදාසිට ක්‍රියාත්මක වන පරිධි.

## රෙගුලාසි පිළිබඳ අරමුණ

දැනට පවතින, සොරකම්කල වාහන තබාගැනීම් හෝ කොටස්කිරීම් නිවාරණය කිරීම සඳහා නීත්‍යානුකූල ලෙස වාහන තබාගැනීම හෝ කොටස්කිරීම සහතික කරගැනීම.

## වාහන අංගනයක් (Yard) යනු

මෙම රෙගුලාසි වලට යටත්වන්නේ, තාප්පයකින් හෝ වැටකින් වසාඇති, පිටත සිට ඇතුලත වාහන හෝ කොටස්කිරීම් පැහැදිලිව නොපෙනෙන බිම් ප්‍රදේශයකි.

- ○ බිම් ප්‍රදේශය සම්පූර්ණයෙන් ආවරණය නොවුනත් පිටත සිට පැහැදිලිව නොපෙනෙන සේ කොටසක් හෝ ආවර්ණය කොට ඇතිවිටද රෙගුලාසි වලට යටත් වනු ඇත.
- ○ අංගනයේ බිම් ප්‍රදේශය වර්ග මීටර 450 කට අඩුවන විට හෝ වාහන කොට කිරීම ව්‍යාපාරික ගණුදෙනුවක් සඳහා නොවන විට මෙම රෙගුලාසි වලට යටත් නොවනු ඇත. එහෙත් බිම් ප්‍රමාණය වර්ග මීටර 450 කට අඩු වූවත් වාහන කොටස් කිරීම ව්‍යාපාරික ගණුදෙනුවක් සඳහා නම් රෙගුලාසි වලට යටත් වනු ඇත.
- ○ ප්‍රාදේශීය ප්‍රවාහණ අධ්‍යක්ෂක ගේ අනුමැතිය ඇතිව, නඩත්තුව සඳහා වාහන කොටස් කිරීම සිදුකරන විට රෙගුලාසි වලට යටත් නොවේ.

**ඉබරකි ප්‍රාන්ත පොලීසිය**

## ලියාපදිංචියට යටත් නොවන අවස්ථා.

දෙවරක් ලියාපදිංචි කිරීම වැළැක්වීම සඳහා, සමාන හෝ යටත්වන රෙගුලාසි යටතේ දැනටමත් ලියාපදිංචි වී ඇතිවිට ලියාපදිංචි වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වේ. (පහත වගුව බලන්න.)

○ : අදාල වේ.　— : සම්පූර්ණයෙන් නිදහස්.　△ : අර්ධ වශයෙන් නිදහස්.

<table>
<tr><th></th><th>නඩත්තු කටයුතු සඳහා කොටස් කිරීම.</th><th>කොටස් කොට ඉවත් කිරීමේ අංගන හිමිකරු.</th><th>පාවිච්චිකල ාහන වෙළඳුන්.</th><th>වෙනත්. ④</th></tr>
<tr><td>ලියාපදිංචි කිරීම.</td><td rowspan="3">— ①</td><td>—</td><td>○</td><td>○</td></tr>
<tr><td>අනිත් පාර්ශ්වය හැඳුනාගැනීම ස්ථිර කරගැනීම.</td><td rowspan="2">△ ②</td><td rowspan="2">— ③</td><td>○</td></tr>
<tr><td>අදාල ලේඛණ සංරක්ෂණය.</td><td>○</td></tr>
</table>

① නඩත්තුව සඳහා පමණක් කොටස් කිරීමට අවසර ඇත. කොටස් කිරීම වෙනත් කාර්යයන් සඳහා නම් ලියාපදිංචි විය යුතුය.

② වාහන කොටස් කොට ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා, වාහණ ප්‍රතිචක්‍රීකරණ නීතියට අනුව "අදාල රාජ්‍ය ආයතනයේ", දත්ත පරිගණක ගත කොට ඇතිවිට. වෙනත් ක්‍රම මඟින් සිදුවන වාහන කොටස් කිරීම හෝ තබාගැනීම ලියාපදිංචියට යටත් වේ.

③ නැවත පාවිච්චිය සඳහා වාහනයක් ඉවත් කිරීම / ලබාගැනීම (පාවිච්චි කල වාහනයක් ලෙස විකිණීම සඳහා) සිදුවන විට, අනිත් පාර්ශවයේ හඳුනාගැනීමට අදාල සහතික සහ දත්ත වාර්තා තැබීම අවශ්‍ය වන නිසා ලියාපදිංචියෙන් නිදහස් වේ.

④ මෙම නීති රෙගුලාසි වලට යටත් වන්නේ, නඩත්තු කටයුතු සඳහා ලියාපදිංචිය ඇති හෝ පාවිච්චි කල වාහන වෙළඳාමට ලියාපදිංචි වී ඇති ව්‍යාපාරිකයින් හැර අනිත් අයවළුන් වේ. යමෙක් ලියාපදිංචියෙන් තොරව අදාල කටයුතුවල නියැලෙන්නේ නම් රෙගුලාසි වලට යටත් වනු ඇත.

## විමසීම්.


- ○ ඉබරකි ප්‍රාන්ත පොලිස් මූලස්ථානයේ "මහජන කටයුතු අංශය" ආරක්ෂාව තහවුරු කිරීමේ ව්‍යාපෘති කාර්යාලය. වාහන අංගන අකර්මණ්‍යතා පිළිබඳ නියාමක නිළධාරී.　**029-301-0110(ප්‍රධාන අංකය)**
- ○ අදාල පොලිස් ස්ථානයේ මහජන ආරක්ෂක අංශය.
- ○ නිල වෙබ් අඩවිය, ඉබරකි ප්‍රාන්ත පොලීසිය.
  **http://www.pref.ibaraki.jp/kenkei/**

## ලියාපදිංචි කිරීම.

ඔබ ඉබරකි ප්‍රාන්තයේ වාහන කොටස්කිරීම ඇරඹීමට බලාපොරොත්තු වන්නේනම් ඊට පෙර වාහන අංගනය, මහජන ආරක්ෂාව පිළිබඳ කොමිසමෙහි ලියාපදිංචි වියයුතුය.

ඔබ 2017-4-1 වන විටත් වාහන කොටස්කිරීම අරඹා ඇත්නම්, 2017-6-3 දිනට පෙර වාහන අංගනය ලියාපදිංචි කලයුතුය.

- ○ මේවනවිටත් වාහන ප්‍රතිචක්‍රීකරණ නීතියට යටත්ව ලියා පදිංචි වී ඇත්නම්, මෙම රෙගුලාසියට යටත් නොවනු ඇත.
- ○ ලියා පදිංචි කිරීමට, වාහන අංගනයේ පිහිටීම, පරිමාණ දත්තයන්, සහ බිම් ප්‍රමාණය තුල ඇති වෙනත් පහසුකම්, පිළිබඳ විස්තර ඇතුලත් වේ.
  ඉදිරිපත් කලයුතු ලියකියවිළි වශයෙන්, වාහන අංගන බිම් ප්‍රදේශයේ සැලස්ම හෝ සිතියම, අදාල බිම් ප්‍රදේශය පාවිච්චි කිරීම සඳහා ලබාගත් අවසර පත්‍රය ඉදිරිපත් කලයුතුය.
- ○ ලියා පදිංචියෙන් අනතුරුව, ස්ථානය පිළිබඳ යම් වෙනස් කිරීමක් / කටයුතු නවතා දැම්මක් / නැවත ඇරඹීමක්, ඇතිවන විට ඒ පිළිබඳව දැනුම් දී ලියාපදිංචිය යාවත්කාල කලයුතු වීම.
- ○ ලියාපදිංචිය සිදුකලයුතු කාර්යාලය යන්නේ, වාහන අංගනය පිහිටා ඇති ස්ථානය අදාලවන පොලිස් ස්ථානයේ “මහජන ආරක්ෂාව පිළිබඳ අංශය” වනු ඇත.

## වාහන ලබාගත් අයවළුන් පිළිබඳ හඳුනාගැනීම සහතික කිරීම.

අංගනයට වාහනයක් ලබාගන්නා විට, අදාල පුද්ගලයාගේ නම / ලිපිනය ස්ථිර කරගැනීමට අවශ්‍ය වේ. ඔහුගේ / ඇයගේ රියදුරු බලපත්‍රය හෝ එවැනි හැඳුනා ගැනීමේ සහතිකයක් පරීක්ෂාකිරීම මගින් එය සිදුකල යුතුය. වාහනයට අදාල තත්ත්ව පරීක්ෂණ සහතිකය ආදී ලේඛණ ඔබ සන්තකයට ගත යුතුය.

වාහනයේ නීත්‍යානුකූළ හිමිකරුගේ නම සහ වාහනය ඔබ අතට පත්කරන තැනැත්තාගේ නම වෙනස් වන විට, බලය හෝ හිමිකම පැවරීමේ සහතිකයක් ලබාගත යුතුය.

ඔබ ලබාගත් වාහනය සොරාගත් වාහනයක් බවට යම් හෝ සැකයක් පහළවන්නේ නම් වහාම අදාල පොලිස් ස්ථානයට දැන්විය යුතුය.

- ○ වාහනයට අදාල සහතික / ලේඛණ වල මුල්පිටපත් ලබාගත යුතුය.
- ○ සොරාගත් වාහනයක් බවට සැක කලහැකි අවස්ථා.
  - ▪වාහනයේ එන්ජිමේ අංකය / වාහනයේ චැසියේ අංකය, සූරා අපැහැදිලි කොට ඇති විට.
  - ▪වාහනයේ යතුරු සිදුර හෝ යතුරු සිලින්ඩරයට හානි සිදුකොට ඇති විට.
  - ▪වාහනය තුල තැබියයුතු අත්‍යාවශ්‍ය සහතික පත්‍ර වන, තත්ත්ව පරීක්ෂණ සහතිකය (Shaken-sho) / අත්‍යාවශ්‍ය වගකීම් රක්ෂණ සහතිකය (Jibaiseki), සාධාරණ හේතුවක් රහිතව වාහනය සමඟ නොලැබෙන විට.

## අදාල ලියවිලි සංරක්ෂණය.

වාහන ලබාගත් අයවළුන්ගේ හැඳුනාගැනීම සහතික කිරීමට අදාල ලේඛණ සංරක්ෂණය කලයුතු වීම.

අදාල ලේඛණ උප පිටපත්, අඩුම වශයෙන් වසරක කාලයක් සංරක්ෂණය කලයුතු වීම.

- ○ ලබාගන්නා උපපිටපත, මුල්පිටපතෙන් පිටපත් යන්ත්‍රයක් භාවිතයෙන්, පිටපත් කඩදාසි යොදාගෙන ලබාගත යතුවීම.
  ඩිජිටල් කැමරාවකින් හෝ ස්කෑනරයකින් ලබාගත් දත්ත ඡායා පිටපත් වලංගු නොවනු ඇත.

## බිම් කොටස පාවිච්චි කිරීමේ අයිතිය පැවරීම සම්බන්ධව.

ඉඩම හෝ ගොඩනැගිල්ල පැවරීම හෝ විකිනීමට පෙර, ඉඩම් හිමියා විසින්, අදාල බිම් කොටස තුල සොරාගත් අයථා වාහන කොටස් කිරීමක් සිදුනොවන බවට ස්ථිර කරගැනීමට අත්‍යාවශ්‍ය වේ.

ඉඩමේ පාවිච්චිකිරීමේ අයිතිය පැවරීමෙන් පසුව හෝ, සොරාගත් වාහන භාවිතය සිදුවන බව දැනගත්විට, වහාම පැවරුම අවලංගු කලයුතු වීම.

## වාහන අංගන පරීක්ෂාව.

ලිපි ලේඛණ පරීක්ෂාව හෝ පුද්ගලයන්ගෙන් ප්‍රශ්ණකිරීම සඳහා වාහන අංගනයේදී අදාල පහසුකම්, කාර්යාලය, අංගනය, ආදීයය අවශ්‍යවූවිට පරීක්ෂාකිරීමට පොලීසියට අවසරය ඇත.

## දඬුවම් පැමිණවීම.

අදාල රෙගුලාසි පැහැර හරින්නන් සඳහා දඬුවම් නියම කෙරෙනු ඇත.

○ මාස 3 ක් හෝ ඊට අඩු සිරගත කිරීමක් හෝ යෙන් 300,000 ක් හෝ ඊට අඩු දඩයක් පහත අවස්ථාහිදී පැණවිය හැක.

- ・අනවසරයෙන් හෝ අයථා ලියා පදිංචියක් සහිතව වාහන කොටස් කිරීම.
- ・භාරකරුගේ / අයිතිකරුගේ අවසරය රහිතව වාහන රැගෙන ඒම.
- ・වාහන වල අයිතිකරු, හඳුනාගැනීමට අදාල ලිපි ලේඛණ සංරක්ෂණය කිරීමට අපොහොසත් වීම.

○ යෙන් 300,000 ක් හෝ ඊට අඩු දඩ මුදලකට යටත් වීම.

- ・වාහන අංගනයේ වෙනස් කිරීම් යාවත්කාල කොට වාර්තා කිරීමට අපොහොසත් වීම හෝ අයථා ලියාපදිංචිය.
- ・වාහන අංගනය පරීක්ෂාකිරීමට විරුද්ධ වීම, වැලැක් වීම හෝ ප්‍රශ්ණ කිරීම් වලට අසත්‍ය පිළිතුරු සැපයීම සිදුවන විට.